විදු ලොව

පසුගිය දිනක අවසන්වුනු 2020 ඕස්ට්‍රේලියා සමුළුව, 21වන ශතවර්ෂයේ ගොඩනැගෙන නවීන ඕස්ට්‍රේලියාවක සැකසුම සඳහා වඩාත් විශිෂ්ඨ අලුත් අදහස් ගොනුකරග ැනීම වෙනුවෙන් පැවැත්වූවකි. ඒ වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථ ාව ප්‍රජා නායකත්වයට, ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ට, ව්‍යාපාර වලට, මෙන්ම සාමාන්‍ය ජනතාවටද ලැබී තිබිනි. එහිදී අධ්‍යාපනය සහ විද්‍යාව, ආර්-ථිකය, පරිසරය, ගොවිතැන සහ ග්‍රාමීය සංවර්ධනය, සෞඛ්‍යය, ඕස්ට්‍රේලියානු ආදිවාසී ජනතාව, පවුල සහ සමාජය, කලාව, ආරක්ෂාව, සහ ඕස්ට්‍රේලියානු ආණ්ඩුවේ අනාගත දැක්ම යන ප්‍රධාන අංශ 10ක් කෙරෙහි අවධානය යොමු කල අතර සමුළුවේ සෞඛ්‍ය අංශය සඳහා පමණක් ඉදිරිපත්කර තිබූ අදහස් ප්‍රමාණය දහස ඉක්මවන ලදි. සමුළුව අවසානයේ දී සෞඛ්‍ය අංශය වෙනුවෙන් මුලටම කතාබහට ලක්වූයේ ජීවී ඇසක් වෙනුවට කෘතිම ලෙස සකස්කෙරෙන 'බයෝනික් ඇස' පිළිබඳවයි.

අන්ධ මිනිසුන්ට දැකීම ඇතිකරලීම සඳහා තැබියහැකි කුමන හෝ බලාපොරොත්තුවක් කෙරෙහි මිනිසුන්ගේ විශේෂ අවධානය යොමුවීම නොවැලැක්විය හැක්කකි. ලොක ජනගහනයෙන් මිලියන 1.5 ක් පමණ වෙතැයි ගණන් බැලෙන දෘෂ්ටි විතානයේ සෛල ක්‍රමයෙන් විනාශවී යන රෝගී තත්වයටත්, වයසට යාමත් සමඟ සිදුවන පෙනීමේ දුර්වලතාවයටත් මෙසේ නිපදවන 'බයෝනික් ඇස' සාර්ථ ක ප්‍රතිඵලයක් වනු ඇතැයි විද්‍යාඥයන්



සිතයි. මෙවැනි රෝගීන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් විද්‍යාඥයන් දක්වන්නේ දෘෂ්ටිය සඳහා සකස්වී තිබිය යුතු ඇසේ සිට මොළය කරා තොරතුරු ගෙනයන දෘෂ්ටි පද්ධතිය, මෙවැනි වූ, එනම් පෙනීම සහිතව ඉපිද පසුව දෘෂ්ටිය අහිමිවීගිය රෝගීන්ගේ සම්පූර්යෙන්ම සකස්වී තිබීමයි.

මේ 'බයෝනික් ඇස' පිළිබඳව පර්යේෂණ මේ වනවිටත් ඕස්ට්‍රේලියාව තුල මෙන්ම අඩුතරමේ ලෝකයේ තවත් කණ්ඩායම් තුනක් විසින් වත් බොහෝ ඉදිරියට ගෙන ගොස් තිබේ. නමුත් ඕස්ට්‍රේලියාව කෙරෙහි ඒ වෙනුවෙන් විශේෂ බලාපොරොත්තු ලෝකය තබා තියෙන්නේත් නිකම් නොවේ. මෙල්බන් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ග්‍රේම් ක්ලාක් මුල්වී පවත්වනලද පර්යේෂණවල විශිෂ්ට ප්‍රතිඵලයක් ලෙස, ලෝකය පුරා දහස්ගණනින් ප්‍රයෝජනයට ගැනෙන 'බයෝනික් කණ' මුලින්ම නිපදවා 1978 දී ඒ වෙනුවෙන් නෛතික අයිතිය පවරාගෙ න තියෙන්නේ ඕස්ට්‍රේලියාවයි. මහාචාර්ය ක්ලාක් පැවසුවේ තමාගේ පර්යේෂණ කටයුතු සඳහා මුදල් සපයාගැනීම ඒ දිනවල ඉතාම අසීරු කටයුත්තක් වූ බවත්, ජනතාවගෙ මුදල් පරිත්‍යාගයන් ලබාගැනීමට පවා තම කණ්ඩායමට ඒ දිනවල සිදුවූ බවත්, ඒ නිසාම රොටරි, ලයන්, සහ එපෙක්ස් වැනි ආයතන වෙතින් ඔවුන් ලැබූ සහය ඉතාමත්ම අගයකරන බවත්ය. ඒ අනුව රඩිගේ ආණ්ඩුව වෙතින් ඕස්ට්‍රේලියානු විද්‍යාඥයන්ට 'බයෝනික් ඇස' නිපදවීම වෙනුවෙන් වන පර්යේෂණ සඳහා ඩොලර් මිලියන 40 ක මුදලක් ලබාගැනීමට හැකිවීම සමුළුවේ අරමුණු පිළිබඳව වූ විශ්වාසවන්ත සලකුණක් වනු ඇත.

'බයෝනික් ඇස' සකස් කිරීම සඳහා ලෝකය පුරා විද්‍යාඥයන් දැනට පර්යේෂණ යොමුකර තිබෙන්නේ මෙසේයි. දෘෂ්ටිය වෙනුවෙන් උත්තේජනය කලයුතු මොළයේ ස්නායු ඇසේ දෘෂ්ටි විතානයේ සැත්කමක් මගින් තැන්පත් කරනු ලබන ක්ෂුද්‍ර ප්‍රමාණයේ පතුරු හෝ ඉලෙක්ට්‍රෝඩ ගණනාවක් මගින් උත්තේජ කරනු ලබයි. එම උත්තේජක ඇතිකිරීමට හේතුවන දෘෂ්ටි සංඥ (පණිවිඩ) දෘෂ්ටි විතානයට යොමුකිරීම සඳහා විශේෂයෙන් සකස් කෙරුනු කුඩා වීඩියෝ කැමරාවක් රෝගියා විසින් කණ්ණාඩියක් පළඳින ආකාරයෙන් ඇසේ ඉදිරිපිට පළඳා ගනී. එම කැමරාව හා එයට ඇඳපුනු කුඩා පරිගණක දත්ත සැකසුමක් මගින් තෝරා බේරා ගැනෙන දෘෂ්ටි සංඥ තරංග ලෙසට ඇසේ දෘෂ්ටි විතානයට යොමුකරයි. ඉතා සියුම්ව සකස්කරගත යුතුවන සංකීර්ණ පද්ධතියක ප්‍රතිඵලය ඒ සඳහා යොදාගැනෙන ක්ෂුද්‍ර පතුරු හෝ ඉලෙක්ට්‍රෝඩ ප්‍රමාණය මත රඳා පවතී යැයි විද්‍යාඥයන් විශ්වාස කරයි. එම විශ්වාසයේ ප්‍රතිඵල මිනිස් දෘසක් ඉදිරිපිට දිගහැරෙන දිනය බොහෝ දුර නොවනු ඇත.

ආචාර්ය
විද්‍යානි මනතුංග

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

ලංකාවේ

'කොහොමද ශිරෝමි, කාලෙකට පස්සෙ?'

බස් නැවතුමේදි කාලෙකට පස්සෙ අඳුනන කෙනෙක්ව දැක්ක මං එහෙම ඇහුවා.

'ආ., මේ මේනකානෙ, ඒත් මෙයා මේ කිව්වා එහා පැත්තෙ ලංකාවෙ කෑල්ලක් ඉන්නවා කියලා'.

මට පිටුපාලා හිටිය ශිරෝමි මගෙ ඇමතුමෙන් මං පැත්තට හැරෙමින් කිව්වෙ එයාගෙ දුවව පෙන්නලා.

'හැබැයි මම නං කෑල්ලක් නෙවෙයි, සම්පූර්ණ එකක්.'

මමත් විහිළුවෙන්ම කිව්වත් අපේ දරුවන්ගෙ සිංහල භාෂාව ගැන පුංචි පසුතැවීමක් හිතේ ඉතිරි වුණා. මේ සිදුවීම වෙලා කාලයක් ගත වෙලා තිබුණත්, හිතේ එකතු වුණු පුංචි පුංචි සිදුවීම් කීපයක් නිසා ඒ ගැනත් යමක් ලියන්න හිතුණා.

ලංකාවෙදි පොලිස්කාරයා, ආමිකාරයා, ලියුම්කාරයා, පත්තරකාරයා, කිරිකාරයා කියන වචන සාමාන්‍ය ජීවිතයෙදි එදිනෙදැ භාවිතයේ තිබුණා. අදටත් එහෙමයි. කවුරුත් ඒ ගැන අපැහැදීමකින් කතා කරන්නෙ නෑ. ඉස්කෝලෙ ඉහළ පන්තිවල ඉන්න තරුණ ළමයි ගුරුවරුන් ගැන කතා කරද්දි 'සර් කාරයා, ටීචර් කාරයා' කියන වචන යොදු ගන්නවා. ඒක ගුරුවරුන්ව හඳුන්වන්නට යොදු ගන්න ගෞරවාන්විත පදයක් නෙවෙයි වුණාට මං හිතන්නෙ ඔවුන්ව අගෞරවයට පත් කිරීමේ අදහසින් යොදු ගැහීමකුත් නෙවෙයි, කතා කරන භාෂාවේ පහසුව තකා පාවිච්චියට යොදගත් වචන ටිකක් විතරයි.

හැබැයි අපේ මිනිස්සු දේශපාලකයන්ව හඳුන්වන්න 'කාරයා' කියන පදය අගට එකතු කරගත්තෙ නං ගෞරවයකට නෙවෙයි. හුඟක් වෙලාවට වීරදද්ධවාදීන් ප්‍රේමදාසකාරයා, ජේ.ආර්. කාරයා, ඩෙන්සිල්කාරයා කියලා හැඳින්වීම් කරනවා ලංකාවෙදි අපිට නිතර දෙවේලේ ඇහිලා තියෙනවා.

කාන්තාවන්, යුවතියන් හඳුන්වන්න බඩුව, කෑල්ල කියන අන්වර්ථ නාම යොදු ගන්න අපේ ඇත්තොම වයසක උදවියව හඳුන්වන්න චම්නද, චම්, නිලන්ති, චන්දිමා, ශාමිලා කියනවා වගේම ස්වාමීන් වහන්සේලා 'හක් ගෙඩිය' ලකුණින් ජන්දය ඉල්ලමින් දේශපාලන පොරපිටියට ආව දවස්වල ඒ ගැන තිබුණු අපහැදීම නිසාම මගතොටදී දකින හාමුදුරුවරුන්ට පවා 'කවඩි, බෙල්ලො' කියලා ප්‍රසිද්ධියෙම අප්‍රසාදය පළකරපු හැටි මීගමුව වගේ කතෝලික පරිසරයක ජීවත්වුණු අපිත් දැකලා තියෙනවා. මේ වගේ වචන භාවිතයට වයසක්, තරාතිරමක්, පන්ති භේදයක් වගේ දේවල් බලපෑවෙ නැහැ.

ඒ, ලංකාවෙ වුණාට මෙහෙදි වචන භාවිතයෙදි අපි ඊට වඩා කල්පනාකාරී විය යුත්තෙ මෙහෙ හැදෙන වැඩෙන අපේ දරුවො භාවිතාවට හුරුවෙන්නෙ අපි කතා කරන වචන වල අනුසාරයෙන් එකතු කරගත්ත වචන මාලාවක් හින්දයි.

පහුගිය පාසල් නිවාඩු කාලෙ පවුලෙ අපි හැමෝම එකතු වෙලා ගිය විනෝද චාරිකාවෙදි හවසක තේ මේසෙදි ලංකාවෙ විස්තර කතා කරමින් ඉන්න අතරෙ ලංකාවෙ අය එක එක්කෙනාට 'කාඩ් ගහන' කතාවකුත් කියවුණා. අපිට එහා පැත්තෙ සෙල්ලම් කරමින් හිටිය දරුවො ටික අපේ කතාවල් ගැන කොයි තරම් අවධානෙකින් හිටියද කියලා අපි තේරුම් ගත්තෙ අපේ හිනාවල් මැද්දෙන් 'කාඩ් ගහනවා කියලා ඇයි ඕගොල්ල හිනාවෙන්නෙ?' කියලා ඒ ගැන එයාලා ප්‍රශ්න කරපු වෙලාවෙයි. එයාලා හිතලා තියෙන්නෙත් එයාලා දන්නෙත් බර්ත්ඩේ කාඩ්ස්, පාම් කාඩ්ස් ගැන විතරක් හින්දයි 'කාඩ් ගැහීම' ගැන අපේ හිනාව එයාලට ප්‍රශ්ණයක් වුණේ. පස්සෙ අපේ කතාව පොඩ්ඩකට නවත්තලා අපි එයාලට තේරුම් කරලා දුන්නා ඒ 'කාඩ් ගැහීමේ' අදහස කාට හරි කරන විහිළුවක් සම්මත කිරීමක් වගේ දෙයක් කියලා.

සමහර දරුවො හුරුවෙන්නෙ දෙමව්පියො කතා කරන භාෂාවට. සමහර දරුවො තමන්ගෙ යාළුවන්ව අනුකරණය කරනවා. දරුවො අනුකරණය කරන්නෙ යාළුවන්ව, අසල්වැසියන්ව නම් දෙමව්පියන්ට පුළුවන් ඔවුන්ගෙ කතා විලාශය වැරදි නම් නිවැරදි කරන්න. ඒත් සමහර දරුවන්ගෙ භාෂාව වෙන්නෙ ගෙදර දෙමව්පියන්ගෙ භාෂාව. එතනදි වරින්නෙ දෙමව්පියො සරල නිවැරදි වචන කතා කිරීම. ඒකෙන් අදහස් වෙන්නෙ ව්‍යාකරණානුකූලව ලියන භාෂාවෙන් කතා කිරීම නෙවෙයි. ඒත් ගෙදර පරිසරයෙදි හිතර දෙවේලෙ ඇහෙන පුංචි වචනයකට වුණත් ඉක්මනින් හුරුවෙන දරුවන්ට ඒක සාමාන්‍ය ව්‍යාවහාරයේදි භාවිතා වෙන වචනයක්ද නැත්ද ක්යලා වටහා ගන්න අමාරුයි. එහෙම වුණාම සමහර අවස්ථ ාවන්වලදි දරුවන්ට පිටස්තරයන් ඉදිරියෙ එහෙම නැත්නම් ඔවුන්ගෙ හිත් ඇතුළෙ හෑල්ලුවට ලක් වෙන්නට සිද්ධ වෙනවා, අනුකම්පාවට භාජනය වෙනවා.

සමහර වෙලාවට දරුවො සිංහලෙන් කතා කරද්දි ඉංග්‍රීසි වචන ඒ විදියටම සිංහලට හරවනවා. 'අම්මට එන්න කියන්න පුතේ' කියලා තාත්තා කිව්වොත් දරුවා ඒක ගිහින් කියන්නෙ 'තාත්තිට අම්මිව ඕනි' කියලයි. එතකොට 'මොනවද ළමයො ඔය කතා කරන සිංහල? ' කියල අහන්නෙ නැතුව 'තාත්තිට ඔයාව ඕනි කියලා නෙවෙයි පුතේ ඒක කියන්න ඕනි තාත්ති අම්මිට අඬගහනවා කියලයි' කියල,

මගේ සොයුරාගේ බිරිඳ දවසක් දුවගෙ පන්තියෙ යාළුවෙක් ගැන සොයුරා සමග කියලා තිබුණා 'දුවගෙ පන්තියෙ ලස්සන චූටි කෙල්ලෙක් ඉන්නවා නාමල්, අපේ දුවට හරි ආදරෙයි' කියලා. කාලෙකට පස්සෙ දුව ඒ යාළුවා ගැන කියනවලු 'නිකීටට ලස්සන මල්ලියෙක් ඉන්නවා, අද එයාව ක්ලාස් එකට එක්ක ගෙන ආවා' කියලා. සොයුරා ඇහුවම 'කවුද පුතේ නිකීටා?' කියලා, දුව එකපාරටම කිව්වලු 'ඇයි තාත්ති අර මගෙ ක්ලාස් එකේ ඉන්න ලස්සන චූටි කෙල්ල' කියලා.

ඇත්තටම අපිත් ඔය සිද්ධිය ගැන මතක් කරලා හිනාවුණා. ඒත් අපි අපිම කතා වුණේ කතා කරන දේවල් ගැන සැලකිලිමත් වෙන එක හොඳයි කියලයි. මොකද පවුලෙ අය අතරෙදි ඒක අපිට විහිළුවට කාරණයක් වුණාට අපේම පිරිසක් අතරෙදි දුව ඔය වගේ දෙයක් කිව්වා නං ඒ අය නොකිව්වත් හිතන්න පුළුවනි මේ අවුරුදු හයේ දරුවා වයසට වඩා පැහිලා කියලා. එතනදි ඒ දෝෂාරෝපණය එල්ල වෙන්නෙ ඒ අහිංසක දරුවට වුණත් වැරැද්දද චූටි දුවගෙ නෙවෙයිනෙ.

සමහර වෙලාවට දරුවො සිංහලෙන් කතා කරද්දි ඉංග්‍රීසි වචන ඒ විදියටම සිංහලට හරවනවා. 'අම්මට එන්න කියන්න පුතේ' කියලා තාත්තා කිව්වොත් දරුවා ඒක ගිහින් කියන්නෙ 'තාත්තිට අම්මිව ඕනි' කියලයි. එතකොට 'මොනවද ළමයො ඔය කතා කරන සිංහල?' කියල අහන්නෙ නැතුව 'තාත්තිට ඔයාව ඕනි කියලා නෙවෙයි පුතේ ඒක කියන්න ඕනි තාත්ති අම්මිට අඬගහනවා කියලයි' කියල, කියල දෙනවා නං මං හිතන්නෙ දවසෙ පයය විසි හතරෙන් වැඩි කාලයක් ඉංග්‍රීසියට හුරුවුණ අපේ දරුවන්ට අමුතුවෙන් වෙලාවක් හොයා ගෙන සිංහල උගන්නනවට වඩා ඒක ප්‍රායෝගිකයි කියලයි. එහෙම වුණාම ඊළඟ වතාවෙදි දරුවා කතා කරන්නෙ අර නිවැරදි කිරීමත් එක්කයි.

ඒ නිසාම දරුවන්ගෙ සිංහල භාෂාව නිවැරදිව කතා කරන්න කියලා දෙන එකත් විශේෂයෙන්ම මේ රටවල්වල ජීවත් වෙන දෙමව්පියන්ගෙ වගකීමක් වෙන්නෙ පාසැලේදි ගුරුවරුන් ගෙන් ඒ යුතුකම ඉෂ්ඨ නොවෙන බව අපි හැමෝම දන්න හින්දයි.

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය